**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2017**

-----------------------------------------------------------

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 56 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 අප්‍රේල් 26 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිවිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 මතය ව්‍යාවනය

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණ ද දිස්ත්‍රික් කාර්යාලවලින් අයකරනු ලබන බදු ආදායම් මුදල් පදනම මත ගිණුම්ගතකර තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

(i) පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සිදු කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 9 ඡේදය ප්‍රකාරව වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දී ඇති ප්‍රමිතීන් හා ව්‍යවහාරයන් පදනම් කරගෙන ප්‍රතිපත්තියක් සකස්කර ගත යුතුය. එහෙත් ඊට අනුකූල නොවන ලෙස සේවකයින්ගේ සේවා කාලය හා අවසන් වරට ලබාගත් වැටුපෙන් භාගයක් ලෙස පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ii) ආයතනය විසින් දැනට භාවිතා කරමින් පවතින සේවා කාලය හා අවසන් වරට ලබාගත් වැටුප පදනම් කරගෙන සේවකයින් සඳහා සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සිදුකර තිබුණු අතර එම ගණනය කිරීම් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාල වෙන් කිරීම රු.948,438 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 47 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන්හි සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට නැවත ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු වුවත් සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතුය. එහෙත් සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.1 (ආ) යටතේ දක්වා තිබූ දේපළ පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු රු.676,169,345 ක ඉඩම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් අතර නිරූපනය කර තිබුණි. මෙම දේපල වලින් කොටසක් බදු පදනම මත ලබා දී තිබූ බව නිරීක්ෂණය වූ අතර එම දේපල ආයෝජන දේපල හා විකිණීම සඳහා පවතින දේපල නම් අදාල පරිදි වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද වාර්ෂිකව සිදු කරන ඉඩම් අත්පත් කර ගැනීම් හා විකුණුම් ආදිය එම තොගයට ගැලපිය යුතු වුවද, එය නිසි පරිදි

සිදු කර නොතිබූ අතර 2003 හා 2006 වර්ෂවලදී සුළු ගැලපුමක් පමණක් සිදුකර තිබුණි. ඒ හේතුවෙන් 1978 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 39 ක් ගත වී තිබුණද ඉහත තොග වටිනාකම එකම අගයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති අංශයේ වාර්තා අනුව ලැබිය යුතු ඛනිජ සම්පත් ආදායම රු.108,684,214 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.60,250,626 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ආදායම රු.48,433,588 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.6,073,745 ක් සමුච්චිත අතිරික්තයට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.5,775,431 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,543,468 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම රු.4,231,963 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී කලින් ලැබී තිබූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම් රු.212,870 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) දීර්ඝ කාලයක සිට රාජ්‍ය ආයතන 4 කින් අය විය යුතු ඉඩම් බදු ආදායම රු.39,472,992 ක් හා, ආයතන 10 කින් අයවිය යුතු ඉඩම් විකුණුම් ආදායම් රු.103,923,311 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වැඩ අවසන් කර දැනට භාවිතයේ පවතින ලිදුල බංගලාව, ෆාම් ගාර්ඩන් වත්තට අයත් ගොඩනැගිල්ල හා දවුල් කුරුඳුවත්තට අයත් ගොඩනැගිලිවලට අදාලව රු.1,468,138 ක් ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ තවදුරටත් දක්වා තිබුණි.

(ඌ) ඉඩම් ලබා දුන් නිලධාරීන් 10 දෙනෙකුගෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයකරගෙන තිබූ රු.100,000 ක අත්තිකාරම්, ඉඩම් විකුණුම් අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කර සමුච්චිත අතිරික්තයට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) අයවිය යුතු භිඟ පරිහරණ ගාස්තු හා ප්‍රවේණි ගාස්තු ගිණුම්ගත කර නොතිබූ අතර දිස්ත්‍රික්ක 09 කට අදාලව පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත නොකල වටිනාකම පිළිවෙලින් රු.4,256,405 ක් හා රු. 1,017,990 ක් විය.

(ඒ) දීර්ඝ කාලයක සිට අයකර ගැනීම අවිනිශ්චිත වූ ණයගැති ශේෂ රු.මිලියන 2,392 ක් එනම්, මුළු වත්කම්වලින් සියයට 49 ක්, ඉදිරි වර්ෂය තුළ අයකරගත නොහැකි වුවද, එම ණය ගැතියන්ගෙන් රු. මිලියන 8.2 ක් පමණක් බොල්ණය ලෙස අඩු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, බොල් ණය වෙන් කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර සභාව විසින් ලබාදුන් තොරතුරුවලට අනුව, මෙම ණය අයකර ගැනීම අවිනිශ්චිත වුවද, ණය පිළිබඳ විමර්ශනයක් සිදුකර ප්‍රමාණවත් පරිදි වෙන්කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ විවිධ ආදායම් අයිතම 06 ක වටිනාකම රු.122,897,000 ක් හා ආදායම් අංශයේ ආදායම් වාර්තාවල දක්වා තිබූ වටිනාකම රු.26,371,334 ක් වූයෙන් රු.96,525,666 ක පැහැදිලි නොකළ වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(අ)

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
| --- | --- | --- |
| (i) ගොඩනැගිලි | 11,168,945 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ii) මෝටර් රථ | 68,571,828 | |
| (iii) ලිපිද්‍රව්‍ය තොගය | 726,534 | |
| (iv) ඉඩම් | 676,169,345 | ඉඩම් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛන/ උපලේඛන |
| (v) හදබිම අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය | 54,911,756 | ශේෂ සනාථ කිරීම් |
| (vi) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය | 319,698 | |

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් වසර 12 කට අධික කාලයක සිට කොමිෂන් සභාවට අයවිය යුතු ලෙස රු.2,352,148,782 ක් දක්වා තිබුණද අවසන් වරට විගණිත 2016 වර්ෂයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, එවැනි ශේෂයක් සභාවට ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි. තවද, ඉහත ශේෂය සනාථ කරගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් සහ වෙනත් අදාල විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූයෙන් ඉහත ණයගැති ශේෂයේ පැවැත්ම නිවැරදිභාවය හා සම්පූර්ණතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 12 කට අධික කාලයක සිට රාජ්‍ය ආයතන 04 කින් අයවිය යුතුව පවතින රු.11,480,095 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරයේ මැදිහත් වීම මත සියලුම පාර්ශවයන් කැඳවා තීරණයක් ලබා ගත යුතු බවට 2016 මාර්තු 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කොමිෂන් සභාව වෙත දන්වා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 18 කට අධික කාලයක සිට විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් හා වර්ෂ 1 සිට 8 කට අධික කාල පරාසයක් තුල සේවය හැරගිය/ වැඩ තහනම් කල සේවකයින් 45 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 653,098 ක් අයනොවී පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ඉඩම් විකුණුම් අත්තිකාරම් තුල වර්ෂ 10 කට අධික වූ රු.10,433,000 ක් ද, වසර 5 ත් 8 ත් අතර රු. 910,000 ක්ද, වසර 2 ත් 5 ත් අතර රු.1,160,000 ක් ද වූ අතර සමස්ත ඉඩම් විකුණුම් අත්තිකාරම්වලින් සියයට 83 ක් වසර 10 කට වඩා පැරණි ශේෂයන් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන්දි අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.109,959,493 ක් වූ අතර වසර 12කට අධික කාලයක සිට මෙම ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මූලා ප්‍රකාශනවල දක්වා තිබූ බදු කුලී අත්තිකාරම් වලින් සියයට 80 ක් හෙවත් රු.11,216,000 ක් 2003 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාලසීමාව තුල සභාව විසින් අත්සතු කරනු ලැබූ ඉඩම් වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් වලින් සමන්විත වී තිබුණි. 2004 අගෝස්තු 12 වන දිනැති අංක අමප/04/0858/001/005/111 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, මෙම ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ඉහත මුදල්, අත්තිකාරම් ලෙස වර්ෂ 12 කට අධික කාලයක සිටද, 2011 වර්ෂයේ බදු කුලී අත්තිකාරම් ලෙස ආයතන 2 කින් ලබාගෙන තිබූ රු.2,240,000 ක් වසර 6 ක කාලයක සිටද නිරවුල් කිරීමකින් හෝ ආදායමට ගැනීමකින් තොරව පැවතුනි.

(ඊ) වෙළඳ හා අනෙකුත් ගෙවීම් යටතේ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ගෙවිය යුතු වටිනාකමින් රු.800,130 ක් වසර 11 කට අධික කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත<br>(1) වගන්තිය | යම් තැනැත්තෙකුට අයිති ඉඩම් අක්කර 50ට වැඩි කෘෂිකාර්මික ඉඩම් පවරා ගැනීම හා ඒ ඉඩම් ඵලදායීව යොදා ගැනීමට කටයුතු කල යුතු වුවද, සභාවට පවරාගෙන ඇති අක්කර 58 ක් වූ ඌරනිකාඩුවත්ත ඉඩම සංවර්ධනය කිරීමට හෝ බදු දීමට හෝ විකිණීමේ පදනමට ලබා දීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 19 (අ) වගන්තිය | ව්‍යවස්ථාපිත නිශ්චය තීරණය කිරීමේදී ප්‍රකාශක විසින් තමාට තබා ගැනීමට සුදුසු ඉඩමක් සඳහා කැමැත්තක් ප්‍රකාශ කර තිබුණේ නම් එය සැලකිල්ලට ගතයුතු වුවද, එයට පටහැනි ලෙස වෙනත් ඉඩම් ප්‍රකාශක වෙත වෙන්කර තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. |
| (iii) | 14 වන වගන්තිය | ඉඩම්වල ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීමේදී ප්‍රකාශකයාගේ පවුල තුල පැවරීම් සිදු කල හැකි වුවද, ඊට පටහැනිව බාහිර පාර්ශවයන් වෙත පවරා තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්, අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, සභාව විසින් 2004 ජුනි 30 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් අනුමැතිය පදනම් කරගෙන දිගින් දිගටම ආයෝජනයන් සිදු කර තිබුණු අතර, මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආයෝජනය කර තිබූ මුදල රු.125,000,000 ක් විය. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පත් ආදායමට බැර කළ යුතු වුවත් වසර 02 ඉක්මවා තිබූ රු.201,500 ක ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2011 අගෝස්තු 25 දිනැති අංක 11/විවිධ (015-1) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුලු රාජ්‍ය ආයතන විසින් ඉඩම් බැහැර කිරීමේදී, කෘෂිකාර්මික කටයුතු සඳහා දෙනු ලබන අක්කර 5ට වැඩි ඉඩම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, හයින්ෆෝඩ්වත්ත ඉඩමෙන් අක්කර 70 රූඩ් 02 පර්චස් 17 ක් තේ වගාව සහ මිශ්‍ර බෝග වගාව සඳහා පුද්ගලික සමාගමක් වෙත බදු දීමේදී එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඉඩම් පැවරීමේ ක්‍රමවේදයද අනුගමනය කර නොතිබුණි. |
| (ඉ) | 2008 අප්‍රේල් 17 දිනැති අංක 2008/පොදු/1 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 1(i) සහ (ii) වගන්ති | අදාල වර්ෂය සඳහා හිඟ පරිහරණ ගාස්තු එම වසර තුලදීම අයකර අවසන් කල යුතු වුවද, වසර ගණනාවක පරිහරණ ගාස්තු අයකර නොතිබුණු අතර, දිස්ත්‍රික් කාර්යාල 11 ක හිඟ පරිහරණ ගාස්තු පිළිබඳ විස්තරද ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.202,513,000 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.120,443,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.82,070,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.51,829,000 ක් වැඩි වී තිබුණද කුලුගල් ආදායම රු.82,195,000 කින් හා, අත්පත් වන්දි පොලී ආදායම රු.26,809,000 කින් සහ, ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.27,645,000 කින් ඉහළයාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. මිලියන 97 ක් වූ සභාවේ ශුද්ධ ලාභය 2015 වර්ෂය අවසානයට රු. මිලියන 55 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 202 ක ශුද්ධ ලාභයක් ඇති වී තිබුණි. තවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ස්ථාවර වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. මිලියන 296 ක් වූ ආයතනයේ දායකත්වය 2015 වර්ෂය අවසානයට රු. මිලියන 269 ක් දක්වා අඩු වී තිබූ නමුත් ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 470 ක් වී තිබුණි.

## 3.2 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට එරෙහිව හා සභාව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව 696 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී පමණක් සභාවට එරෙහිව නඩු 68 ක් ද, සභාව විසින් නඩු 97 ක්ද පවරා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුලදී අධිකරණ තීන්දු ලබා දී තිබූ නඩු සංඛ්‍යාව 42 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1. කාර්යසාධනය

----------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 12 හි 5:1:3 වගන්තිය අනුව අනුමත කරන ලද යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් සෑම ගිණුම් වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට ප්‍රථම රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද 2017 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක ඇතුලත් විය යුතු වාර්ෂික අයවැය ලේඛනය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යන කරුණු ඇතුලත්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය සමාලෝචනය

----------------------------------

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 2 වගන්තිය ප්‍රකාරව, යම් තැනැත්තකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම්, එම තැනැත්තන් අයිතිව තබා නොගැනීම, සුරක්ෂිත කිරීම,පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම් වලින් ඇතිවන රැකී රක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම කොමිෂන් සභාවේ මූලික අරමුණ වේ. එම අරමුණු ඉටුකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් 9 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුනි.

(ආ) 2016 සහ 2017 යන වර්ෂ දෙකෙහිදීම ක්‍රියාකාරී සැලසුම්වල දක්වා තිබුණු ප්‍රධාන ගබඩාව විධිමත් ලෙස රාක්ක ගසා සැකසීම, 5 S ක්‍රමයට බඩු ගබඩා කිරීම, ප්‍රධාන ගබඩාව පරිගණක ගත කිරීම, විධිමත් කාර්යසාධන ක්‍රියාවලියක් ආරම්භ කිරීම, ආයතනයේ භෞතික සම්පත් සංවර්ධනය හා වැඩිදියුණු කිරීමේ නඩත්තු කටයුතු, ලේඛන සංරක්ෂණය කිරීම සහ විධිමත් ලේඛනාගාරයක් ස්ථාපිත කිරීම, අනවශ්‍ය ලිපිගොනු අපහරණය කිරීම, ලේඛනාගාරයේ ඇති ලිපිගොනු පරිගණකගත කිරීම, යනාදී කිසිදු ක්‍රියාකාරකමක් ඉටුකර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ඉඩම් වත්කම් යාවත්කාලීන කිරීම, ක්ෂේත්‍ර විමර්ශන හා පූර්වාදර්ශ සැකසීම, ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දීම, බාල වයස්කාර දරුවන්ට ඉඩම් ලබා දීම, විහාර දේවාලගම් පනත අනුව, ඉඩම් නිදහස් කිරීම සඳහා හඳුනා ගැනීම, පූර්ව නඩු වාර්තා ආශ්‍රයෙන් සිද්ධි අධ්‍යයනය කිරීම, අධිකරණ කටයුතු සම්බන්ධීකරණය සඳහා අන්තර් ආයතන සබඳතා වැඩිදියුණු කිරීම, කොමිෂම වෙත පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කිරීම හා ලේඛන ලියාපදිංචි කිරීම, යනාදී කිසිදු ක්‍රියාකාරකමක් ඉටු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල නිවාස අරමුණු සඳහා ඉඩම් පැවරුම් අංශයෙන් ඔප්පු අංශයට ඔප්පු 3038 ක් යොමු කර තිබුණු අතර, ඔප්පු අංශයෙන් වර්ෂය තුල ඔප්පු 2908 ක් නිකුත් කර තිබුණි. අවස්ථා 13 කදී ඔප්පු 2751 ක් උත්සවාකාරයෙන් බෙදා දීම සඳහා සෘජු වියදම් රු.10,598,796 ක් වැයකර තිබුණි.

(ඉ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පළ කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 100 ක් සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවතුනු අතර වර්ෂය අවසාන වන විටද එම ලිපිගොනු වලට අදාලව වන්දි නිරවුල් කිරීම සිදු කර නොතිබුණි.

(ඊ) දිස්ත්‍රික්ක වශයෙන් පැවතුණු ඉඩම් පිළිබඳ ලැයිස්තුවක් හැරුණු විට එක් එක් වර්ෂය ආරම්භයේ පැවති ඉඩම් ප්‍රමාණය, වර්ෂය තුළ විකුණන ලද ඉඩම් ප්‍රමාණය, බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ එක් එක් වර්ෂය අවසානයට සභාව සතුව පැවති ඉඩම් ප්‍රමාණය තහවුරු වන අයුරින් ඉඩම් ලේඛන යාවත්කාලීනව සකස් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි කොමිෂන් සභාවට අයත් ඉඩම් අක්කර 602 ක් 1982 වර්ෂයේදී පාලනය හා කළමනාකරණය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා දී තිබුණි. එහෙත් 1982 වර්ෂයේදී ජනවසම විසින් එම ඉඩම් පොල් වගාකිරීමේ මණ්ඩලයට භාර දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජනවසම විසින් පොල් වගාකිරීමේ මණ්ඩලයට ඉඩම භාරදීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු වී නොතිබුණු අතර මණ්ඩලය මගින් භුක්ති විඳින මෙම ඉඩම් නියමානුකූල කර ගැනීමට 2017 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) 2011 වර්ෂයේදී මෙම ඉඩමෙන් අක්කර 50 ක ප්‍රමාණයක් බාහිර පුද්ගලයෙකු වෙත රු. 200,000 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව භුක්තිය ලබා දී තිබුණි. මේ අනුව, සභාව සතු ඉඩම් 1982 වර්ෂයේ සිට කිසිදු ආදායම් අයකර ගැනීමකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පැවති අතර 2017 දෙසැම්බර් 31 වන විටත් සභාව විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3. මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

(අ) ගාල්ල හා කොළඹ දිස්ත්‍රික්කවල රාජ්‍ය අංශය සඳහා පවරා දී තිබූ ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් සිදු කල නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 1995 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඉඩම් කැබලි 200 ක් පමණ රාජ්‍ය ආයතන වෙත පවරා දී තිබුණු නමුත්, ඉන් ඉඩම් කැබලි 16 ක් සඳහා පමණක් වන්දි මුදල් අයකරගෙන තිබුණි.

(ii) 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය නියමය අනුව, සභාවට අයත් ඉඩම් කැබලි 16 ක් අත්පත් කරගන්නා බවට 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගැසට් නිවේදන පළකර තිබුණද සභාව විසින් වන්දි අයකර ගැනීම දක්වා සිදුකළ යුතු ඉදිරි කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

(iii) විවිධ අරමුණු සඳහා රාජ්‍ය ආයතන විසින් 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අත්පත් කරගෙන තිබුණු ඉඩම් සම්බන්ධයෙන් සභාවේ හිමිකම තහවුරු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉඩම් වලට අදාල වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කළ අවස්ථා 14 ක් නිරීක්ෂණය විය.

(ආ) ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබා දීම

---------------------------------------

(i) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව ඉඩම් අක්කර 50 ට වැඩි ප්‍රමාණයක් හිමි පුද්ගලයන්ගේ ඉඩම් රජයට පවරා ගැනීම යටතේ 1972 - 1974 අතර කාලසීමාව තුල ඉදිරිපත් කළ ප්‍රකාශන 230 ක් සම්බන්ධයෙන් වසර 40 කට අධික කාලයක් ගත වී තිබුණද ඉන් සියයට 27 ක් පිඹුරු ඉදිරිපත් නොකිරීම මතද සියයට 52 ක් ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීම මතද ව්‍යවස්ථාපිත නිශ්චයන් (හිමිකම් ඇති අක්කර 50) ලබාදීමට නොහැකි වී තිබුණි.

(ii) පිඹුරු ඉදිරිපත් කිරීම, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ මැදිහත්වීමෙන් අදාල ප්‍රකාශක ලවා ඉටුකරවා ගත යුතු වුවද වර්ෂ 40 කට අධික කාලයක් තුල පිඹුරු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙසේ ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීම ප්‍රමාද වීම මත ප්‍රකාශකයින් වෙත වන්දි ගෙවීමද ප්‍රමාද වී තිබුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පත්කඩුවන ග්‍රාමයේ පිහිටි වල්ජාපාලවත්ත ඉඩමෙන් අක්කර 01 රූඩ් 03 පර්චස් 36.16 ක ප්‍රමාණය පෞද්ගලික ආයතනයක් වෙත 2002 ජුනි 11 දින වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබා දී තිබුණි. මුල් වසර 05 ක බදු මුදල් එකවර අය කිරීම හා බදු ගිවිසුම් සඳහා එළඹීමෙන් පසු භුක්තිය භාරදීම සිදු කළ යුතු වුවත්, කිසිදු බදු මුදලක් අය කිරීමකින් තොරව 2002 වර්ෂයේදී භුක්තිය භාරදී තිබුණු අතර බදු දීම සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා දී තිබුණේ ඉන් වසර 9 ක් ගත වීමෙන් පසු එනම් 2011 අගෝස්තු 23 දිනදීය. 2017 දෙසැම්බර් 31 දිනට හිඟ බදු මුදල හා තක්සේරු ගාස්තුව රු.7,262,401 ක් වුවද මේ දක්වා එම හිඟ මුදල් අයකරගෙන නොතිබුණි.

(ඈ) හෝමාගම ටෙම්පල්බර්ග් කර්මාන්තපුරයෙන් හා කාරණාවවත්ත ඉඩමෙන් ඉඩම් කැබලි 04 ක් පුද්ගලික සමාගම් 03 ක් වෙත බදුදීම සමබන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1998 වර්ෂයේදී කර්මාන්තපුරයෙන් සහ 2000 වර්ෂයේදී කාරණාවවත්තෙන් පුද්ගලික සමාගම් දෙකක් වෙත බදු දී තිබූ පිළිවෙලින් අක්කර 01 පර්චස් 11 ක් සහ අක්කර 01 රූඩ් 02 ක් බැගින් වූ ඉඩම් සඳහා 2002 මැයි 23 දිනැති අංක 2002/11 දරන පාලන චක්‍රලේඛය ප්‍රකාරව වසර 5 කට වරක් බදු මුදල් සංශෝධනය කිරීම සිදු කර නොතිබුණි. තවද කර්මාන්තපුරයේ පිහිටි පර්චස් 81.8 ක් වූ ඉඩම් කැබැල්ලක් සඳහා වසර 5 ක වාර්ෂික බදු කුලී මුදල එකවර අයකර ගැනීමෙන් තොරව භුක්තිය භාරදී තිබුණි.

(ii) ඉඩම් කැබලි 3 ක් සඳහා වසර 12 කට අධික කාලයක සිට එකතුව රු.4,571,320 ක් වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කර නොතිබුණි.

(iii) කර්මාන්තපුරයේ II වන අදියර යටතේ වූ කැබලි අංක 10 හි අක්කර 02 ක ප්‍රමාණය 2005 ජූලි 11 දින බදු පදනමට ලබා දී තිබුණු අතර පළමු අවුරුදු 5 සඳහා වූ බදු මුදල සහ තක්සේරු ගාස්තුව රු. 2,312,311 ක් 2016 නොවැම්බර් මාසයේදී ගෙවා තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් බදු ගිවිසුම් සකස් කර නොතිබුණු අතර, රු. 5,280,000 ක බදු මුදල් එදිනට හිඟව පැවතුනි.

(ඉ) හෝමාගම පිහිටි ටෙම්පල්බර්ග් කර්මාන්තපුරයේ කැබලි අංක 11 සහ 15 ට අයත් හෙක්ටයාර 0.414 ක් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 2001 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත බදු දී තිබුණි. එම ආයතනය අසාර්ථක වීම හේතුවෙන් 2007 වර්ෂය දක්වා හිඟ බදු මුදල් අයවී නොතිබියදී ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන හා කොමිෂන් සභාව වෙත දැනුම් දීමකින් තොරව නැවතත් වෙනත් පුද්ගලික සමාගමක් වෙත ලබා දී

තිබුණි. බදු දීමේදී එකවර අයකරනු ලබන වසර 5 ක බදු මුදල් මෙම සමාගමෙන්ද අයකර ගෙන නොතිබුණු අතර කලින් සමාගමේ හිඟ බදු මුදල් නව සමාගම විසින් ගෙවීමට එකඟතාවය පලකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු හිඟ බදු මුදල රු. 3,999,374 ක් විය.

(ඊ) පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු පදනම මත ලබාදුන් ඉඩම් පිළිබඳ සිදුකල නියැදි පරීක්ෂාවේදී රන්දෙනියවත්ත, ලේනවවත්ත, නාගසෝලවත්ත, උඩුගමවත්ත, වැලිපිටියවත්ත, බෝපිටියවත්ත යනාදී ඉඩම් බදුදීම් පිළිබඳව පරීක්ෂාවට භාජනය කෙරුණි. 1974 සිට 1984 වර්ෂ දක්වා වූ කාල පරාසය තුල මෙම ඉඩම් බදු දී තිබුණද ඒ සඳහා බදුදීමට අදාල ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. තවද අදාල මැනුම් කටයුතු අවසන් කිරීම, බදු දීම සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම, බදු කුලී තක්සේරු ලබා ගැනීම, බදු ගිවිසුම් වලට එළඹීම සිදු කර නොතිබුණු අතර වසර 40 කට අධික කාලයක් මෙසේ බදු ගෙවීමකින් තොරව ඉඩම් අක්කර 1310 ක් පමණ භුක්තිවිඳ තිබුණි. ඉඩම් 2 කට පමණක් අදාලව 1984 සිට 2000 දක්වා පමණක් අයවිය යුතු බදු මුදල සහ අධිභාරය රු. 6,873,301 ක් විය.

(උ) පොල් වගා කිරීමේ අරමුණ ඇතිව පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත 1974 මැයි 15 දින පවරා දී තිබුණු මඩකලපුව දිස්ත්‍රික්කයේ පාසිකුඩාවත්ත ඉඩමෙන් අක්කර 269 රූඩ් 3 පර්චස් 39 ක ඉඩම් සංචාරක කර්මාන්තයට අදාලව නිවාඩු නිකේතන සෑදීම සඳහා භාවිතා කර තිබුණි. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් පවරා දෙන ලද යම් ඉඩමක්, එහි යම් නියමයක් හෝ කොන්දේසියක් අනුව ක්‍රියා නොකරන ලද්දේ නම් එම පැවරීම අවලංගු කරනු ලැබිය හැකි වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම, වර්ෂය අවසානයට දක්වා වූ හිඟ බදු මුදල රු. 51,478,177 ක් වී තිබුණු නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) හෝමාගම උතුරු පිටිපන පිහිටි ගබඩාවත්ත නැමැති ඉඩමෙන් අක්කර 50 රූඩ් 03 පර්චස් 60 ක් 1983 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එම ඉඩමෙන් අක්කර 2 ක් පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී අත්පත් යෝජනා ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා වූ ඇස්තමේන්තු මුදල් රු.3,752,286 ක් 1986 හා 1996 වර්ෂවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්ද , රු.20,202,311 ක මුදලක් පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය විසින්ද කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණද විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 31 දින දක්වාත් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර එය පවරා දීමට කටයුතු කර නොතිබුණි.

(එ) කඩුවෙල කොරතොටවත්ත ඉඩම වටා අනවසර කළුගල් කැඩීම දිගටම සිදු වන බව 2011 වර්ෂයේදී කඩුවෙල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබූ අතර එම ඉඩම අනවසර පරිහරණයක් ලෙස සභාව විසින් දැනුවත්ව සිටියද එය වළකාලීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඒ) ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත යටතේ වන්දි මුදල් කොමිෂන් සභාව වෙත ගෙවීමට යටත්ව ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මොන්රෝවියා වත්තෙන් අක්කර 10 ක ප්‍රමාණයක් දේව පතිරාජ විද්‍යාලය වෙත 2014 සැප්තැම්බර් 09 දින කොමිෂන් සභා අනුමැතිය මත පවරා දී තිබුණි. එහෙත්, 2017 දෙසැම්බර් 31 දින දක්වාම වන්දි මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඔ) කොමිෂන් සභාවට අයත් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මාකුරුගොඩවත්ත ඉඩමෙන් අක්කර 16 ක ප්‍රමාණයක් දකුණු පළාත් තරුණ මධ්‍යස්ථානය හා ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අත්පත් කරගෙන තිබුණි. මෙම ඉඩමට අදාල ඉදිකිරීම් 2001 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණු අතර, 2008 වසරට අදාල ඉඩමේ තක්සේරු මුදල රු.31,500,000 ක් වුවද, වන්දි මුදල සම්බන්ධ ගැටළු සහගත තත්ත්වයක් මත විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 31 දින දක්වා අදාල වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) 1998 වර්ෂයේදී අනුරුද්ධ ගම්මානය පිහිටුවීම සඳහා බෙදා දී තිබුණු කොමිෂන් සභාව සතු සෙන්ට්ලෙනාඩ්වත්ත ඉඩමේ ඉඩම් කැබලි 47 ක් අතුරින් කැබලි 8 ක් සඳහා වන්දි මුදල් හා පොලී මුදල් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින දක්වාත් කටයුතු කර නොතිබුණි.

(ක) ගාල්ල කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 320 ක් වූ කොහිලවගුරවත්ත ඉඩමෙන් අක්කර 25 ක් නිවාස සංවර්ධන අධිකාරියද, අක්කර 110 ක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටද, තවත් අක්කර 10 ක් හිටපු අමාත්‍යවරයෙකු විසින් භුක්ති විඳින බව දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් වාර්තා කර තිබුණි. මෙම ඉඩම් නියමානුකූල කර අත්පත් වන්දි හෝ බදු පදනමට ලබා දී වන්දි මුදලක් හෝ බදු ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) කළුතර දිස්ත්‍රික්කයේ පෙම්බෘක්වත්ත ඉඩමේ පිඹුරු අංක 1828 කැබලි අංක 01 න් දැක්වෙන අක්කර 02 රූඩ් 00 පර්චස් 15.18 ක් ඇගලුම් කම්හලක් සඳහා වින්ටර් පැෂන්ස් පුද්ගලික සමාගමට 1992 පෙබරවාරි සිට වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබා දී තිබූ නමුත් එදින සිට මේ දක්වාම සමාගම විසින් බදු ගෙවීම පැහැර හැර තිබුණි. ඒ අනුව 2015 පෙබරවාරි 03 දින දක්වා පමණක් ගෙවිය යුතු හිඟ මුදල රු. 2,661,282 ක් වූ අතර 2016 හා 2017 වර්ෂ 2ට අදාල බදු මුදල හා අධිභාරයද ගණනය කර නොතිබුණි. මෙලෙස කර්මාන්තපුරවලට දීර්ඝකාලීනව ඉඩම් බදු දීමේදී බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අනුගමනය කල යුතු ක්‍රමවේදයක් කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව තීරණය කල යුතු වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් දිගින් දිගටම බදු ගෙවීමෙන් තොරව කර්මාන්ත පවත්වාගෙන යන බැව් නිරීක්ෂණය විය.

(ඡ) හඟුරන්කෙත රත්වැටිය වත්තෙන් තේ කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහිත රූඩ් 2 පර්චස් 16 ක ඉඩම රිකිල්ලගස්කඩ සී/ස සඟරුවන්කෙත කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතියට 1997 මැයි 02 දින ඉඩම් බදු දීමේ සාමාන්‍ය ක්‍රමයෙන් බැහැරව හා වසර 5 ක බදු මුදල් එකවර අයකිරීමකින් තොරව බදු පදනම මත ලබා දී තිබුණි. 2016 මැයි 01 දින වන විට අයකර ගත යුතු හිඟ බදු මුදල සහ අධිභාරය රු.4,596,800 ක් වූ අතර, වසර 15 ක පමණ කාලයක් තුල බදු ගෙවීමකින් තොරව කටයුතු කර තිබූ නමුත්, බදු ගිවිසුම අවලංගු කිරීමට හෝ ඒ සඳහා වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) මොණරාගල දිස්ත්‍රික්කයේ යාලබෝල වත්ත ඉඩමෙන් කොමිෂන් සභාවට පැවරී තිබූ අක්කර 201 ක ප්‍රමාණය 1975 අගෝස්තු 24 දින සීනි සංයුක්ත මණ්ඩලයට භාරදී තිබූ අතර පසුව පැලවත්ත සීනි සමාගම වෙත 1982 සිට 1999 දක්වා අක්කර 196 රූඩ් 00 පර්චස් 04 ක් සහ, 1999 ජනවාරි 20 දින සිට 2011 වර්ෂය දක්වා අක්කර 146 රූඩ් 00 පර්චස් 04 ක් භුක්තිය සඳහා භාරදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වසර 5 ක බදු මුදල් එකවර අය කිරීමෙන් තොරව, සීනි සංයුක්ත මණ්ඩලයට සහ සීනි සමාගමට භුක්තිය භාර දී තිබූ අතර පැලවත්ත සීනි සමාගමෙන් 1982 සිට 2011 දක්වා අය විය යුතු මුළු හිඟ බදු මුදල රු.24,542,165 ක් විය.

(ii) මෙම ඉඩම මැනුම් කිරීම 2005 වර්ෂයේදී සිදු කර තිබුණු අතර ඒ අනුව සමාගම භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය අක්කර 224 රූඩ් 02 පර්චස් 38 ක් බව අනාවරනය වූයෙන් සමාගම විසින් වසර 33 ක කාලයක් අක්කර 78 ක් පමණ අනවසරයෙන් භුක්ති විඳ තිබුණි.

(iii) කොමිෂන් පත්‍රිකා අංක P - 523 ට අනුව 2011 නොවැම්බර් 11 දින සිට වසර 30 කට පැලවත්ත සීනි සමාගමට බදු දීමට තීරණය කර තිබුණු නමුදු 2012 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය පරිදි සී/ස ලංකා සීනි (පුද්) සමාගම වෙත 2012 සැප්තැම්බර් 01 දින සිට පැවරීම සිදු කර තිබූ අතර 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 31 දින දක්වාම බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2 (අ) සහ 3 (1) වගන්තියට පටහැනිව ඉඩම් අක්කර 50 නොඉක්මවූ පුද්ගලයින් 09 දෙනෙකුගේ ඉඩම්ද කොමිෂන් සභාවට පවරා ගෙන තිබුණු බව සිදුකළ විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දින වන විට වසර 45 ක් පමණ ගත වී තිබියදීත් එම පවරාගත් ඉඩම් හෝ විකල්ප ඉඩම් ලබා දීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

**4.4** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්ත් වතුයායෙන් අක්කර 1729 රූඩ් 02 පර්චස් 36 ක් 1994 අප්‍රේල් 21 දිනැති අංක 415/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රු.12,183,100 ක නාමික වටිනාකමක් ගෙවීමට යටත්ව රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී තිබුණු අතර, සංස්ථාව විසින් ආයෝජන මණ්ඩලය වෙත මෙම වතුයාය රු. මිලියන 120 කට විකුණා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පර්ත් වතුයාය තුල පිහිටි ඇපිල් ෆොරස්ට් වතුයායට අයිති එගොඩවත්ත හා කටුකිතුල්කන්ද වත්ත නැමැති ඉඩමෙහි අක්කර 146 රූඩ් 01 පර්චස් 28 ක් 1990 නොවැම්බර් 11 දින විකුණුම්කරයක් මගින් පවරාගත් බවට කොමිෂන් සභාව වෙත පුද්ගලයන් තිදෙනෙකු විසින් 2012 වර්ෂයේ අයිතිවාසිකම් ඉදිරිපත් කර තිබුණි. එම ගැටළුව විසඳීම ඉඩම් උපරිම සීමා අංශයෙන් සිදු කල යුතු වුවද, එසේ කිරීමෙන් තොරව හා සභාවේ මැනුම් අංශයෙන් හෝ නීති අංශයෙන් වෙනත් ලියවිලි හෝ උපදේශනයක් ලබා ගැනීමට හෝ කටයුතු කිරීමකින් තොරව එම ඉඩම් පුද්ගලික ඉඩම් බවට තහවුරු කිරීමට සහකාර අධ්‍යක්ෂ (ආදායම්) විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව අයිතිවාසිකම් ඉදිරිපත් කල පාර්ශවය විසින් එම ඉඩමට අදාලව ඉදිරිපත් කල ලියවිලිවල නිරවද්‍යතාවය කොමිෂන් සභාව විසින් තහවුරු කරගෙන නොතිබුණු අතර එසේ පුද්ගලික ඉඩම් බව සහකාර අධ්‍යක්ෂකවරයා විසින් තහවුරු කර තිබීම රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ආයෝජන මණ්ඩලයටද ප්‍රශ්නගත වී තිබුණි.

(ii) මෙම වතුයායන් සභාව වෙත පවරා ගැනීමේදී අදාල ප්‍රකාශකයින් වෙත කොපමණ ඉඩම් ප්‍රමාණයක් සඳහා වන්දි ගෙවුයේද, වන්දි ගෙවූ දිනය, ගෙවූ මුදල ආදී තොරතුරු තහවුරු කර ගැනීමට වන්දි ගෙවීමේ ලිපිගොනු හෝ ලියවිලි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒ අනුව අයිතිවාසිකම් ඉදිරිපත් කරන පාර්ශවය දක්වා ඇති ඉඩම් කොටස සම්බන්ධයෙන් සමාගමට ඇති අයිතිය සනාථ කර ගැනීමට සාක්ෂි නොතිබුණි.

(ආ) මහ 385 යටතේ ප්‍රකාශනයට යටත් නොවූ ඉඩමක් 1972 දී කොමිෂන් සභාවට පවරාගෙන තිබුණු අතර, මේ සඳහා විකල්ප ඉඩමක් ලෙස අම්බලමානවත්ත ඉඩමෙන් අක්කර 89 ක් ප්‍රකාශක වෙත 2001 සැප්තැම්බර් 25 දින මැනුම් කර වෙන්කර තිබුණි. එම ඉඩමේ අනවසර පදිංචිකරුවන් සිටීම හේතු කොටගෙන අදාල ප්‍රකාශක විසින් භුක්තිය භාරගෙන නොතිබුණි. එසේ වෙන්කර තිබුණු ඉඩමෙන් අක්කර 25ක් සිලිකා ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී වසර 15 ක් සඳහා බදු දී තිබුණු අතර රු.870,000 ක මුදලක් අත්තිකාරම් ලෙස අයකිරීම හැරුණුකොට කිසිදු බදු මුදලක් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

## 4.5 ආර්ථික නොවන ගනුදෙනු

හොරණ ගුරුගොඩ පිහිටි පර්ත් වත්තෙන් අක්කරයක ප්‍රමාණයක් ඉඩම් බදු දීමේ සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව ඇහලුම් කම්හලක් ආරම්භ කිරීම සඳහා සුපර්සීම් ගාමන්ට් ආයතනය වෙත 2003 වර්ෂයේදී භුක්තිය භාර දී තිබූ නමුත් 2003 වර්ෂයේ සිට 2013 දක්වා එකතුව රු.4,087,311 ක බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. තවද එම ආයතනය විසින් කොමිෂන් සභාවේ කිසිදු අවසරයක් ලබා ගැනීමෙන් තොරව එම ඉඩම සහ ගොඩනැගිල්ල රෙදිපිළි මුද්‍රණ ව්‍යාපාරික ආයතනයක් වන බ්‍රිටිෂ් බිලියන් පුද්ගලික සමාගම වෙත 2013 ජුනි 26 දින දිවුරුම් ප්‍රකාශයක් මගින් පවරා දී තිබූ නමුත් පසුව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2013 නොවැම්බර් 29 දින, 30 අවුරුදු කාලයකට කොමිෂන් සභාව මගින් එම පාර්ශවයට බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පැරණි බදුකරුගේ හිඟ බදු මුදල වූ රු.4,087,311 ක් වාරික වශයෙන් ගෙවීමට නව බදුකරු එකඟ වී තිබුණු අතර ඒ අනුව 2017 මැයි 04 දින වන විට රු.3,746,822 ක් ගෙවා තිබුණි. ඒ අනුව, තවදුරටත් අයවීමට ඇති හිඟ බදු මුදල රු.340,489 ක් වී තිබූ අතර හිඟ බදු මුදල මත ගෙවිය යුතුව තිබූ සියයට 10 ක අධිභාර මුදල වූ රු.1,825,000 ක් කොමිෂන් සභාව විසින් කිසිදු පදනමකින් තොරව නිදහස් කර තිබුණි.

(ii) වර්තමාන බදුකරු භුක්තිය භාරගත් 2013 සැප්තැම්බර් 03 දින සිට වසර 4 ක කාලයක් සඳහා නව තක්සේරුවට අනුව අයවිය යුතු බදු මුදල රු.8,640,000 ක් වූ අතර, එම මුදල 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(iii) මෙම ඉඩම 2003 වර්ෂයේදී තක්සේරු කිරීමේදී ඉඩමේ වටිනාකම රු.6,000,000 ක් ද බදු වාර්ෂික කුලිය රු.360,000 ක් ද ලෙස දක්වා තිබුණු අතර 2013 වර්ෂයේ තක්සේරුව රු.3,000,000 ක් සහ බදු කුලිය රු.180,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වසර 10 ක් ගත වීමෙන් අනතුරුව එලෙස වාර්ෂික බදු කුලිය හරි අඩකින් අඩු වීම ගැටළු සහගත තත්ත්වයක් බව විගනණයේදී නිරීක්ෂණය විය. සාමාන්‍යයෙන් බදු මුදල වසර 5 න් 5 ට වැඩි විය යුතු වුවත්, වසර 10 කට පසු බදු මුදල හරි අඩකින් අඩුවී තිබුණි. මෙම ඉඩම් කොටස ප්‍රධාන තක්සේරුකරු මගින් නැවත තක්සේරු කර තිබූ අතර එහිදී වාර්ෂික බදු කුලිය රු. 1,662,000 ක් බව ප්‍රධාන තක්සේරුකරු දන්වා ඇති බවට විගණනය වෙත දන්වා තිබුණි.

## 4.6 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව සතුව පැවති මිට්ෂුබිසි කැබ් රථයක රු.526,700 ක අළුත්වැඩියාවක් පෞද්ගලික ආයතනයකින් ඉටු කර ගැනීම සඳහා 2016 ඔක්තෝබර් 05 දින භාරදී තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් අළුත්වැඩියා නිමකර වාහනය ලබාදී නොතිබුණි.

(ආ) කැබ් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ගරාජයක් වෙත 2016 ඔක්තෝබර් 05 දින භාර දී තිබුණි. එසේ වුවද රථය මාස 09 කුත් දින 18 ක් ප්‍රමාද වී අළුත්වැඩියාව නිම කර භාරදී තිබුණද, වාහනය භාරදීමේ ලිපිය පරිදි ප්‍රමාද ගාස්තු මුදල් හෝ යම් ප්‍රතිශතයක් හෝ අඩු නොකර මුළු මුදලින් සියයට 10 ක මුදලක් නැවත ගෙවීමේ එකඟතාවයට යටත්ව තෙමසක් රඳවා ගෙන මුදල් ගෙවා තිබුණි. එසේම මෙහිදීද අළුත්වැඩියාව සඳහා දින 291 ක් ගත කිරීම මත වූ ප්‍රමාදය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2015 ජුනි 29 දිනැති අංක 01/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව තරඟකාරී රක්ෂණ වෙළඳපළකට ඉඩ සලසා දෙමින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ආයතනය තෝරා ගත යුතු වුවද එයට පටහැනිව සභාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සභාව සතු වාහන සඳහා රක්ෂණාවරණ ලබාගෙන 2017 වර්ෂයේදී රු.1,142,385 ක් ගෙවා තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල කළමනාකරණය

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 12 හි 9. 2 (ඉ) වගන්තිය අනුව නව කාර්යමණ්ඩල අවශ්‍යතාවයක් පවතී නම් ඒ සඳහා වන අවශ්‍යතාවය සනාථ කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අනුමත කාර්ය මණ්ඩලය තුල නොවූ තනතුරු 54 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන්/සේවකයන් බඳවා ගෙන තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරක, තක්සේරු පරීක්ෂක 3 දෙනෙකු සහ සැලසුම් ශිල්පී දෙදෙනෙකු ලෙස නිලධාරීන් 06 ගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

## 5. තිරසර සංවර්ධනය

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය තුලදී කඩිනම් ඔප්පු ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ඔප්පු ලබාදීම සඳහා ගොනු පරීක්ෂා කිරීම හැරුණු කොට අභ්‍යන්තර විගණන විමසුම් 02 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන සැලැස්මේ දක්වා තිබුණු අංශයන් ආවරණය කෙරෙන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි. ඉඩම් විකිණීම් සහ බදුදීම් පිළිබඳ පරීක්ෂාවන්, වන්දි හා තක්සේරු අංශයේ කාර්යයන් පිළිබඳ පරීක්ෂාවන්, ආදායම් සහ මැනුම් අංශයේ කටයුතු පරීක්ෂාවන්, නීති අංශයේ කාර්යයන් සහ දිස්ත්‍රික් බල මණ්ඩල කාර්යාලවල විගණන කටයුතු සිදුකර නොතිබුණි.

## 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුලත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ඉංජිනේරු ඇස්තමේන්තුව රු.5,282,146 ක් වූ පුත්තලම දිස්ත්‍රික් බලමණ්ඩල කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඇස්තමේන්තු මුදලින් සියයට 40 ක් වූ රු.2,112,878 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව 2014 නොවැම්බර් 27 දිනදී නිදහස් කර තිබුණු අතර, එම මුදල් නිදහස් කර වර්ෂයකට ආසන්න කාලයක් ඉක්ම යන තෙක් අදාල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) මූලික ඇස්තමේන්තුව සකස් කිරීමේදී හඳුනාගත හැකිව තිබුණු කඩා ඉවත් කළ යුතු ගොඩනැගිල්ල සම්බන්ධයෙන් රු.296,300 ක අතිරේක ඇස්තමේන්තුවක් සකස්කර ඉදිකිරීම් සිදුකරන කොන්ත්‍රාත්කරු වෙතම එය පවරා තිබුණි.

(iii) ගොඩනැගිලි සැලැස්ම සඳහා අදාල පළාත් පාලන ආයතන අනුමැතිය, නාගරික සංවර්ධන අධිකාරියේ සහ පරිසර අධිකාරියේ අනුමැතිය ආදිය ලබාගෙන නොතිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් වරයා හා අදාල කොන්ත්‍රාත්කරු සමග එකඟ වූ ගිවිසුම පරිදි වැඩ අවසන් කර භාරදිය යුතු දිනය 2016 ජනවාරි 11 දින වුවද, භාරදී තිබුණේ 2016 ජූලි 29 දින දීය. ඒ අනුව කොන්ත්‍රාත්කරු සමග එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තුව දිනකට රු.2,362 ක් බැගින් මාස 6 ක් සඳහා අයවිය යුතු ප්‍රමාද ගාස්තුව රු.800,718 ක් නොසලකා හැර සභාව විසින් මුළු මුදලම දිස්ත්‍රික් ලේකම් වරයා වෙත ගෙවා තිබුණි.

(ආ) සභාව සතු ඉඩම් වල අයිතිය පැවරීම සඳහා 2017 අගෝස්තු 21 දින ගාල්ල ඇල්පිටිය ක්‍රීඩාංගනයේ පැවති ඔප්පු ප්‍රදානය කිරීමේ උත්සවය සඳහා රු.5,950,280 ක් වැය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1. (අ) වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කොට නොතිබුණි.

(ii) ඔප්පු ප්‍රදානෝත්සවයේ සියළු කටයුතු සඳහා මිල ගණන් කැඳවීම, සැපයුම්කරු තෝරා ගැනීම, පිරිවිතර සැකසීම යනාදී කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව සිදු කර තිබුණි.

(iii) දැන්වීම් පුවරු මුද්‍රණය සහ ඔප්පු කවර මුද්‍රණය සඳහා රු.1,024,380 ක්, වියදම් කර තිබුණු නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.9 වගන්තිය අනුව එම කාර්යය වෙනුවෙන් ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3. 8 වගන්තිය ප්‍රකාරව හදිසි ස්වාභාවික ව්‍යසන අවස්ථාවකදී හෝ අනපේක්ෂිත සමාජ වගකීම් වැනි අවස්ථා වලදී හදිසි ප්‍රසම්පාදන ලෙස සලකා මිලදී ගැනීම් සිදු කලහැකි වුවත් ඊට පටහැනි ලෙස ඔප්පු බෙදා දීමේ උත්සවයේ කාර්යයන් හදිසි ප්‍රසම්පාදන ලෙස සලකා රු. 5,950,280 ක් වැය කර තිබුණි.

(ඇ) කොමිෂන් සභාව 2017 නොවැම්බර් 05 දින මාතරදී පවත්වා තිබූ ඔප්පු උත්සවය සඳහා රු.909,395 ක් වැය දරා තිබුණි. එහිදී ගීත ගායනා කිරීම සඳහා ගායක ගායිකාවන් සිව්දෙනෙක් වෙනුවෙන් රු.200,000 වැය කර තිබුණි. ඒ අනුව ඔප්පු බෙදා දීම මූලික හා ප්‍රධාන අරමුණ වන උත්සවයක මුළු වියදමින් සියයට 22 ක් ඉන් පරිබාහිර කටයුත්තක් වෙනුවෙන් වියදම් දැරීම හේතුවෙන් මු.රෙ 128 (එ) අනුව රජයේ කටයුතු ඉටුකිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්භාවය, අවංකභාවය යන කරුණු පිළිබඳ අවධානය යොමු කොට නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කල ගොඩනැගිල්ලේ එක් එක් අංශ ඇලුමිනියම් පාටිෂන් කිරීම සඳහා රු. 768,200 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම කාර්යය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2. 4. 1 වගන්තිය පරිදි තාක්ෂණික ඇගයීම් කමිටු පත් කොට නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.9 (ආ) වගන්තිය පරිදි ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මුළු පිරිවැයෙන් සියයට 20 කට ආසන්න ප්‍රමාණයක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි.

(iii) හදිසි ප්‍රසම්පාදනයන් ලෙස සලකා අදාල කාර්ය ඉටුකර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.1 වගන්තිය ප්‍රකාරව හදිසි ප්‍රසම්පාදනයන් ලෙස අර්ථ දක්වනු ලබන කාර්යයක් යටතට අදාල නොවන්නක් බවට නිරීක්ෂණය විය.

(iv) ඉටු කල කාර්යය සාර්ථකව නිම කර ඇති බවට ආයතනයේ වගකිව යුතු සහ තාක්ෂණික දැනුමැති නිලධාරියෙකු විසින් සහතික කිරීමකින් තොරව මුදල් ගෙවීම සිදු කර තිබුණි.

**6.3 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර සියයට 32 සිට සියයට 1944 දක්වා වූ පරාසයක විචලනයන්ද, අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 28 සිට සියයට 808 දක්වා වූ පරාසයක විචලනයන් ද නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ii) ප්‍රාග්ධන වියදම් සඳහා සලසා තිබුණු අයවැය ප්‍රතිපාදනවලින් ගොඩනැගිලි ඉදි කිරීම් සහ මෝටර් වාහන මිලදී ගැනීමට සලසා තිබුණු ප්‍රතිපාදන සියයට 100 කින්ම ඉතිරිව තිබුණු අතර, පරිගණක හා උපාංග මිලදී ගැනීම සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 87 ක් ද, ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 65ක් ද උපයෝජනය කර නොතිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-------------------------------------

2004 පෙබරවාරි 24 දිනැති 01/2004 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6.1.4 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද, 2015 සහ 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2018 පෙබරවාරි 28 දින වන විටත් සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------------

පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේ ගෙවා තිබුණු රු. 17,000,000 ක් වසර 16 ක් තිස්සේ පරිගණක අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණු නමුත් එම අත්තිකාරම් නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට විගණිත දිනය වූ 2018 මාර්තු 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ----------------------------- | | ------------- |
| (අ) | මෙහෙයුම් පාලනය | (i) | රාජ්‍ය අංශය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |
| | | (ii) | අත්පත් ඉල්ලීම් ක්‍රමානුකූලව ලේඛනගත කර නොතිබීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ආකාරය නිශ්චය කිරීමට නොහැකි වීම. |
| | | (iii) | අත්පත් ක්‍රියාවලිය හැකි ඉක්මනින් අවසන් කර වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | වාහන කළමනාකරණය | (i) | රිය අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබීම. |
| (ඇ) | ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීම | (i) | බදුකරුවන් තෝරා ගැනීමට ක්‍රමවේදයක් නොතිබීම. |
| | | (ii) | මූලික මුදල් අය කිරීමෙන් තොරව භුක්තිය භාරදීම් සිදුකර තිබීම. |
| | | (iii) | බදු ගිවිසුම් නොතිබීම මත හිඟ බදු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි වීම. |
| | | (iv) | නිදහස්ව ඇති ඉඩම් කල්තියා හඳුනාගෙන ඵලදායී ආදායම් ඉපයීමේ ව්‍යාපෘති සඳහා යෙදවීමට සභාව කටයුතු කර නොතිබීම. |
| | | (v) | මැනුම් නියෝග ලබා දී තිබියදීත් මැනුම් කටයුතු ප්‍රමාද වීම. |
| | | (vi) | ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කර තිබියදී ව්‍යාපෘති කමිටු මඟින් ඇගයීම් කර තීන්දු දීමේ ප්‍රමාදය මත ඉඩම් නිශ්කාර්යව පැවතීමෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වීම. |
| | | (vii) | අමාත්‍ය මණ්ඩල නිර්දේශ ලබා ගැනීමට යොමු කල යුතු ව්‍යාපෘති සඳහා කඩිනමින් ඒ සඳහා යොමු කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රමාදවීම් සිදු වීම. |
| (ඈ) | ගබඩා පාලනය | (i) | බඩු ලේඛන පොත් තුලනය නොකිරීම. |
| | | (ii) | මධ්‍යගත ඉන්වෙන්ට්‍රිය සහ අංශවල ඉන්වෙන්ට්‍රි තුලනය නොකිරීම. |
| (ඉ) | ස්ථාවර වත්කම් පාලනය | | අපහරණය කරන ලද ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඊ) | අත්තිකාරම් පාලනය | | කාර්යය නිම වූ විගස අත්තිකාරම් පියවා නොතිබීම. |